ප්‍රාචීන මධ්‍යම විභාගයට ඉදිරිපත් වූ අපේක්ෂකයින් වෙත,

ප්‍රාචීන මධ්‍යම පරීක්ෂණයේ සමත් අසමත් බව තීරණය කරන ආකාරය පිළිබඳ බොහෝ දෙනෙකුට පවතින ගැටලු නිරාකරණය කර ගැනීම පහත විස්තරය දක්වමි. එය හොඳින් අධ්‍යයනය කර ඔබට ඇති ගැටලු නිරාකරණය කර ගන්නා ලෙස දන්වා සිටිමි.

| ලකුණු මට්ටම හා නිර්ණායක | ලබාදෙන සංකේතය |
|---|---|
| සමත් | P |
| අත්හිටුවා ඇත | N |
| තීරණය කර නැත | - |
| 0 - 29 දක්වා | F |
| ලකුණු 30 - 39 දක්වා | W |
| ලකුණු 40 - 54 දක්වා | S |
| ලකුණු 55 - 69 දක්වා | C |
| ලකුණු 70 - 100 දක්වා | D |

| විෂයයන් හා ප්‍රශ්න පත්‍ර | ලැබූ සාමර්ථ්‍යයන් |
|---|---|
| සිංහල I පත්‍රය | S |
| සිංහල II පත්‍රය | S |
| සිංහල III පත්‍රය | S |
| සිංහල | P |
| පාලි I පත්‍රය | S |
| පාලි II පත්‍රය | S |
| පාලි III පත්‍රය | S |
| පාලි | P |
| සංස්කෘත I පත්‍රය | S |
| සංස්කෘත II පත්‍රය | S |
| සංස්කෘත III පත්‍රය | S |
| සංස්කෘත | P |
| ඉහත ප්‍රතිඵලය හෝ C , D සාමර්ථ්‍යයන් සහිත ව හෝ ලබා ඇත්නම් විභාගය සමත් වේ. | |

| විෂයයන් හා ප්‍රශ්න පත්‍ර | ලැබූ සාමර්ථයන් |
|---|---|
| සිංහල I පත්‍රය | S |
| සිංහල II පත්‍රය | S |
| සිංහල III පත්‍රය | S |
| සිංහල | P |
| පාලි I පත්‍රය | S |
| පාලි II පත්‍රය | W |
| පාලි III පත්‍රය | S |
| පාලි | P |
| සංස්කෘත I පත්‍රය | S |
| සංස්කෘත II පත්‍රය | S |
| සංස්කෘත III පත්‍රය | W |
| සංස්කෘත | P |

ඉහත ප්‍රතිඵලය ලැබූ ඇතමෙකුට විභාගය සමත් ලෙස දක්වා ඇත. ඊට හේතු වනුයේ ඔහුගේ එක් විෂයයක ප්‍රශ්න පත්‍ර 3හිම සමස්ත ලකුණුවල එකතු ව (40x3) 120කට වඩා වැඩි වීමයි.

| විෂයයන් හා ප්‍රශ්න පත්‍ර | ලැබූ සාමර්ථයන් |
|---|---|
| සිංහල I පත්‍රය | W |
| සිංහල II පත්‍රය | S |
| සිංහල III පත්‍රය | S |
| සිංහල | - |
| පාලි I පත්‍රය | S |
| පාලි II පත්‍රය | W |
| පාලි III පත්‍රය | S |
| පාලි | - |
| සංස්කෘත I පත්‍රය | S |
| සංස්කෘත II පත්‍රය | S |
| සංස්කෘත III පත්‍රය | W |
| සංස්කෘත | - |

ඉහත ප්‍රතිඵලය ලැබූ ඇතමෙකුට සමස්ත විෂයය ප්‍රතිඵලය ඉදිරියෙන් **(–)** සංකේතය (තීරණය කර නොමැත) ලැබී ඇත. ඊට හේතුව ඔහුගේ එක් විෂයයක ප්‍රශ්න පත්‍ර 3හිම සමස්ත ලකුණුවල එකතු ව (40x3) 120කට වඩා අඩු වීමයි. මෙවන් ප්‍රතිඵලයක් ලැබූ අයෙකු W සංකේතය ලැබූ ප්‍රශ්න පත්‍රයට පමණක් නැවත පෙනී සිට විභාගය සම්පූර්ණ කළ යුතු ය. 2020 වර්ෂයේ සිට එක් විෂයයක එක් ප්‍රශ්න පත්‍රයක් පමණක් අසමත් නම් එම අසමත් ප්‍රශ්න පත්‍රයට පමණක් පෙනී සිට විභාගය සම්පූර්ණ කර ගැනීමට අවස්ථාව හිමි වේ.

| විෂයයන් හා ප්‍රශ්න පත්‍ර | ලැබූ සාමර්ථ්‍යයන් |
|---|---|
| සිංහල I පත්‍රය | S |
| සිංහල II පත්‍රය | F |
| සිංහල III පත්‍රය | S |
| සිංහල | F |
| පාලි I පත්‍රය | C |
| පාලි II පත්‍රය | W |
| පාලි III පත්‍රය | F |
| පාලි | F |
| සංස්කෘත I පත්‍රය | S |
| සංස්කෘත II පත්‍රය | S |
| සංස්කෘත III පත්‍රය | F |
| සංස්කෘත | F |

ඉහත ප්‍රතිඵලය එක් විෂයයකට හෝ දෙකකට හෝ තුනට ම ලැබූ අයෙකු වේ නම් අදාළ විෂයය හෝ දෙක ම හෝ තුන ම සඳහා නැවත පෙනී සිටිය යුතු ය. එක් ප්‍රශ්න පත්‍රයකට පමණක් පෙනී සිට විභාගය සම්පූර්ණ කර ගැනීමට අවස්ථාව හිමි නො වේ.

| විෂයයන් හා ප්‍රශ්න පත්‍ර | ලැබූ සාමර්ථ්‍යයන් |
|---|---|
| සිංහල I පත්‍රය | S |
| සිංහල II පත්‍රය | N |
| සිංහල III පත්‍රය | S |
| සිංහල | N |
| පාලි I පත්‍රය | C |
| පාලි II පත්‍රය | S |
| පාලි III පත්‍රය | S |
| පාලි | P |
| සංස්කෘත I පත්‍රය | S |
| සංස්කෘත II පත්‍රය | S |
| සංස්කෘත III පත්‍රය | C |
| සංස්කෘත | P |

ඉහත ප්‍රතිඵලය අනුව සිංහල විෂයය ඉදිරියෙන් N සංකේතවත් වේ. එහි සිංහල II පත්‍රයට ඉදිරියෙන් ද N දැක් වේ. මෙවන් අවස්ථාවක සිංහල II පත්‍රයට පමණක් පෙනී සිට විභාගය සම්පූර්ණ කර ගැනීමට අවස්ථාව හිමි නො වේ. සම්පූර්ණ විෂයය ම එනම්, සිංහල ප්‍රශ්න පත්‍ර 3ට ම පෙනී සිටිය යුතු ය.

**(විභාග අක්‍රමිකතාවක් සිදු කර ඇති අවස්ථාවක මෙවන් ප්‍රතිඵලයක් හිමිවන අතර සම්පූර්ණ විභාගයේ ම ප්‍රතිඵල අවලංගු කිරීමකින් තොර ව අදාළ විෂයයේ පමණක් ප්‍රතිඵල අවලංගු කර ඉතා ලිහිල් දඬුවමක් පමණක් ලබා දී ඇත.)**

| පෙර වර්ෂයක විභාගයට ඉදිරිපත් ව පහත ප්‍රතිඵලය ලබා තිබුණි නම් | |
|---|---|
| විෂයයන් හා ප්‍රශ්න පත්‍ර | ලැබූ සාමර්ථ්‍යයන් |
| සිංහල I පත්‍රය | S |
| සිංහල II පත්‍රය | S |
| සිංහල III පත්‍රය | S |
| සිංහල | P |
| පාලි I පත්‍රය | C |
| පාලි II පත්‍රය | S |
| පාලි III පත්‍රය | S |
| පාලි | P |
| සංස්කෘත I පත්‍රය | S |
| සංස්කෘත II පත්‍රය | S |
| සංස්කෘත III පත්‍රය | F |
| සංස්කෘත | R |

ඉහත ප්‍රතිඵලයට අනුව අයදුම්කරු සංස්කෘත විෂයයෙහි III පත්‍රය පමණක් අසමත් ව ඇත. නව සංශෝධනයට අනුව ඔහු 2020 වසරේ පෙනී සිටිය යුතු වූයේ සංස්කෘත III පත්‍රයට පමණි. එසේ ඉදිරිපත් ව දකුණු පස වගුවේ සඳහන් පරිදි ප්‍රතිඵලයක් ලබා ඇත්නම්,

| මෙවර පහත සඳහන් ලෙස ප්‍රතිඵලයක් ලබා ඇත්නම්, | |
|---|---|
| විෂයයන් හා ප්‍රශ්න පත්‍ර | ලැබූ සාමර්ථ්‍යයන් |
| සිංහල I පත්‍රය | |
| සිංහල II පත්‍රය | |
| සිංහල III පත්‍රය | |
| සිංහල | |
| පාලි I පත්‍රය | |
| පාලි II පත්‍රය | |
| පාලි III පත්‍රය | |
| පාලි | |
| සංස්කෘත I පත්‍රය | |
| සංස්කෘත II පත්‍රය | |
| සංස්කෘත III පත්‍රය | W |
| සංස්කෘත | - |

මෙවර ලබා ඇත්තේ W සාමර්ථ්‍යයක් නිසා විභාගය සම්පූර්ණ කිරීමට සුදුසුකම් ලබා නැත. එබැවින් නැවතත් එම ප්‍රශ්න පත්‍රය සඳහා පෙනී සිටිය යුතු ය. මෙසේ එක් ප්‍රශ්න පත්‍රයකට පමණක් පෙනී සිට විභාගය සම්පූර්ණ කිරීමට අවම වශයෙන් S සාමර්ථ්‍යයක් වත් ලබා ගත යුතු ය.

පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි,

ලේකම්,

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගම